චක්‍රලේඛ අංකය -11/2024

මගේ අංකය -සමු/අයි/CCD/01
සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව(බ.ප.)
ආදිපාද වීදිය,
කොළඹ .01
2024.12. 23

සකසුරුවම් හා ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිති හා වෙනත් සමිතිවල( විවිධ සේවා සමුපකාර සමිති හා විශාල පරිමාණයේ සමිති හැර) සභාපතිවරුන් වෙත.

**සකසුරුවම් හා ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිති හා වෙනත් සමිතිවල අධ්‍යක්ෂ මණ්ඩලය/කාරක සභා රැස්වීම් දීමනා ගෙවීම.**

උක්ත මැයෙන් මා විසින් නිකුත් කරන ලද 2014.12.26 දිනැති 06/2014 අංක දරණ චක්‍රලේඛයට වැඩිමනක් වශයෙන් මෙම චක්‍රලේඛය නිකුත් කරමි.ඉහත සඳහන් ඕනෑම සමුපකාර සමිතියක කාරක සභා/ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා එක් කාරක සභිකයෙකුට/ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකුට රු.500.00 ක උපරිමයකට යටත්ව දීමනාවක් ලබා ගැනීමට අවකාශ සලසා ඇත. එකී චක්‍රලේඛයේ 3 වගන්තිය ඉවත් කරමින් එම චක්‍රලේඛය සංශෝධනය කරන අතර ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නව විධිවිධාන ඇතුලත් කරමින් මෙම චක්‍රලේඛය නිකුත් කරමි.

02.) ඒ අනුව පහත සඳහන් පරිදි කාරක සභා රැස්වීම් වලට සහභාගී වීම වෙනුවෙන් කාරක සභිකයන්/ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් සඳහා දීමනා ලබා ගැනීමට හිමිකම් ඇත.

| සමිතියේ මාසික ශුද්ධ ලාභය | එක් රැස්වීමක් සඳහා ලබාගත හැකි දීමනාව | මසකට දීමනා ලබාගත හැකි උපරිම රැස්වීම් ගණන |
|---|---|---|
| රු.10,000.00 | 500.00 | 01 |
| රු.10,001.00 - 50,000.00 | 1000.00 | 01 |
| රු.50,001.00 -100,000.00 | 1500.00 | 02 |
| රු.100,001.00 - 200,000.00 | 2000.00 | 02 |
| රු.200,000.00 ට වැඩි | 2500.00 | 03 |

03.) පසුගිය මාසයේ ආදායම් ප්‍රකාශය මත පදනම්ව මෙම දීමනාව ලබාගත යුතු අතර අදාළ ආදායම් ප්‍රකාශය සමිතියේ පොත්පත් අනුව නිවැරදි බවටත් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට අනුව පිළියෙල කර ඇති බවටත් භාණ්ඩාගාරික/ කළමනාකරු විසින් සහතික කළ යුතු අතර තව දුරටත් සමිතියේ අභ්‍යන්තර විගණක/ අභ්‍යන්තර විගණන කමිටුව එය පරික්ෂා කළ බවටත් නිවැරදි බවටත් ලිඛිත තහවුරුවක් ලබාදිය යුතුය.

04.) සමිතියේ මූල්‍ය තත්ත්ව විශ්ලේෂණ වාර්තාව අනුව මූල්‍ය වත්කම් ඌණතාවයක් හෝ මුළු වත්කම් ඌණතාවයක් සහිත සමිතිවල කාරක සභිකයන්ට/ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ට මෙම දීමනාව ලබා ගැනීමට හැකියාවක් නැත.

05.) මෙම දීමනාව ලබා ගැනීමෙන් පසු බස්නාහිර පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් සිදු කරනු ලබන වාර්ෂික විගණනයේදී ආදායම් ප්‍රකාශයේ ශුද්ධ ලාභයේ වෙනසක් සිදු වී ඇති බව අනාවරණය වුවහොත් ගැලපීමට යටත් වන අතර වැඩිපුර ලබාගෙන ඇති දීමනා අධිභාරයක් මගින් නැවත අයකර ගැනීමට සමුපකාර සමිතියට නීතිමය ඉඩකඩ පවතියි.

එම්.ඒ.පී. ජයකොඩි
සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ
සමුපකාර සමිති රෙජිස්ත්‍රාර්
බස්නාහිර පළාත